බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>My Number | USJP/EEX-06/2025 | ලිපිනය<br>Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල<br>Post Box 10, Gangodawila<br>නුගේගොඩ, ශ්‍රී ලංකා<br>Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය<br>Your Number | | | |
| දුරකථනය<br>Telephone | 011-2801481, 011-3132496 | වෙබ් අඩවිය<br>Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස්<br>Fax | 011-2802753 | විද්‍යුත් තැපැල<br>E-mail | exams.edecu@sjp.ac.lk |


2025-02-10

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

**විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි II කොටස (නව විෂය නිර්දේශය) 2021 පුනර් අපේක්ෂකයින් සඳහා අයදුම්පත් කැඳවීම - 2025**

**01.** පුනර් පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට සහ පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි

| | |
|---|---|
| පුනර් පරීක්ෂණ අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය | www.external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය “V” අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කරගත හැක. |
| **පුනර් පරීක්ෂණ ගාස්තු** | එක් විෂයයක් සඳහා රු. 5000.00<br>විෂයයන් 2ක් සඳහා රු. 7000.00<br>විෂයයන් 3ක් සඳහා රු. 9000.00<br>විෂයයන් 4ක් සඳහා රු. 11000.00<br>විෂයයන් 5ක් සඳහා රු. 13000.00<br>විෂයයන් 6ක් සඳහා රු. 15000.00 |
| **2024 අගෝස්තු/සැප්තැම්බර් පවත්වන ලද උපාධි II පරීක්ෂණයට අයදුම් කර වෛද්‍ය හේතු මත විභාගයට වරප්‍රසාද ලැබූ 2021 වර්ෂයේ ලියාපදිංචි අපේක්ෂකයන්ද පුනර් පරීක්ෂණ ගාස්තු ගෙවීම අනිවාර්ය වේ.** | |
| අයදුම්පත් යොමුකළ යුතු ලිපිනය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. |
| **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය** | **2025 පෙබරවාරි 27** |

## 02. **සැලකිය යුතුයි**

I. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පුනර් පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් අනතුරුව, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතුවේ.

II. 2021 වර්ෂයේ ලියාපදිංචි සිසුන් උපාධි II පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරික සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. එසේ ගෙවා නොමැති අයදුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2025/02/27** වන අතර එම දිනයෙන් පසුව කිසිඳු හේතුවක් මත අයදුම්පත් භාරගනු නොලැබේ.

IV. පුනර් පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවෙකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. (එහි ඡායා පිටපතක් ළඟ තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංක වලට ගෙවන ලද මුදල් පිලිබඳව විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.)

V. නියමිත පරිදි මුදල් නොගෙවන ලද අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. පුනර් පරීක්ෂණයට අදාළ කාල සටහන www.external.sjp.ac.lk යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරිම් වෙබ් අඩවිය හරහා පමණක් සිදුකරන බැවින් නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය කිරිම අත්‍යවශ්‍ය වේ.

VII. විදේශ ගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ EDECU online Distance Supervision Exam පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක.ඒ සඳහා වන විස්තර http://external.sjp.ac.lk/online-examinations-for-migrated-students/ යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

VIII. **නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍ර external.sjp.ac.lk/Management (Public) General (External) Degree/Examinations/Admission Card වෙත පිවිස ඔබගේ ජාතික හැදුනුම්පත් අංකය V අක්ෂරය රහිතව ඇතුලත් කිරීමෙන් ලබාගත හැකි අතර විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.**

<u>උපාධියක් සම්පූර්ණ කිරීම : උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන්</u>

උපාධියක් ලැබීමට, සිසුවෙකු විසින් පහත කරුණු සපුරාලිය යුතු වේ:

- සම්භාර පැය 90ක් සම්පූර්ණ කර තිබීම, සහ
- එක් එක් අධ්‍යයන වර්ෂයක් සඳහා අවම වශයෙන් 2.00ට නොඅඩු **GPA** මට්ටමක් ලබා තිබීම, සහ
- සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා 2.00ක අවම සමස්ත **GPA** මට්ටමක් ලබා තිබීම, සහ
- අසමත් ශ්‍රේණි (**'D'** හෝ **'E'**) නොතිබීම, සහ
- එක් අධ්‍යයන වර්ෂයක් සඳහා දුර්වල ශ්‍රේණි (**'C-'** හෝ **'D+'**) එකකට නොවැඩිවීම, සහ
- සම්පූර්ණ උපාධි පාඨමාලාව සඳහා වන දුර්වල ශ්‍රේණි (**'C-'** හෝ **'D+'**) සංඛ්‍යාව 03 නොඉක්මවීම, සහ
- සම්භාර රහිත පාඨමාලාව සඳහා 'සමත්' (**'C'** ශ්‍රේණිය) ලබා තිබීම, සහ
- ප්‍රථමයෙන්ම විශ්වවිද්‍යාලයට බැඳුණු අධ්‍යයන වර්ෂයේ සිට උපරිම වශයෙන් වසර (07)ක් ඇතුලත ඉහත දක්වා ඇති සියලු අවශ්‍යතාවන් සපුරා තිබීම.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025.02.10